# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

# 1991 අංක 01 දරන
# වයඹ පළාතේ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

(අනුමත කල දිනය : 1991. 02. 06)

වයඹපළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජුනි මස 29 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv කොටසේ පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිලදී ගත හැක.

මිල : රු. 5.00 තැපැල් ගාස්තුව : රු. 2.00

## වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය

පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන් පළාත් පාලන ආයතනවලට ලබාදීමට හැකියාව ලැබෙනු සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මේ ප්‍රඥප්තිය 1980 අංක 36, 1985 අංක 10 සහ 1987 අංක 16 දරන පනත්වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. 1. (අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයකට පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ ඒවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය. පළාත් පාලන සේවයේ සාමාජිකයන් පළාත් රාජ්‍ය සේවයට මුදාහැරීම.

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත් කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක16 දරන පළාත් පාලන සේවා පනතේ 20 අ වන වගන්තියේ (2) සහ (3) වන උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම සාමාජිකයාට අදාළ විය යුතුය.

2. (අ) පළාත් පාලන සේවයේ සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවකදී කලින් කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 අ වන වගන්තියේ (4) උප වගන්තියේ විධිවිධාන, අදාළ වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාළ විය යුතුය.

(ආ) එවැනි සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට පත්කරනු ලැබූ දින සිට පළාත් පාලන සේවයෙන් ඉවත්ව ගිය තැනැත්තෙකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඔහු එසේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු වූයේ නම් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග වල නියමයන්

පීබී 003885 (92/09)—2,500

ප්‍රකාර ප්‍රදානයක් ලැබීමට ඔහුට හිමිකම ඇත්තේය. එසේ වුවද, එකී ප්‍රදානය ඔහුට ගෙවනු ලැබිය යුත්තේ පළාත් රාජ්‍ය සේවයෙහි ඔහුගේ සේවා නියුක්තිය අවසාන වීමෙන් පසුව පමණකි.

(ඇ) ඉහත (2) 1 (අ) වන උප වගන්තිය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු රජයේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකුව සිටියේ නම්, පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවය, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

**පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථානමාරු, විශ්‍රාම ගැනීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුබව**

3. පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයෙකු පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් මුදාහැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධුරයෙන් අස්කිරීම සහ ඔහු පිළිබඳ විනය පාලනය ඒ සාමාජිකයා පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තියෙහි යෙදී සිටිනතාක් කල් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

එසේ වුවද එවැන්නකු පිළිබඳ විනය පාලන කටයුතු ඉහත සඳහන් පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තියේ(1) වන උප වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග වලට අනුකූල විය යුතුය.

**පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ සේවය පළාත් පාලන ආයතන වලට ලබාදිය හැකි බව.**

4.1. පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ නිලධරයකුගේ සේවය, පළාත තුල පිහිටි යම් පළාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, පළාත් රාජ්‍ය සේවා සේවා කොමිෂන් සභාව විසින් සුදුසුයයි සළකනු ලබන කාල පරිච්ඡේදයට, එවැනි පළාත් පාලන ආයතනයකට ඔහුගේ සේවය ලබාදිය හැකිය යන්න එසේ පළාත් රාජ්‍ය සේවයට පත්කරනු ලබන සෑම නිලධාරියෙකු සම්බන්ධයෙන්ම වූ නියමයක් සහ කොන්දේසියක් වන්නේය.

2. ඉහත 1 වන උප වගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකුගේ සේවය පළාත් පාලන ආයතනයට ලබාදුන් අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයේ වෙනත් යම් නිලධරයකුට අදාළ වන විනය පාලනයටම ඔහු යටත් වන්නේය.